R 8418


දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/7/1/29/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.: MOD/PAC/ARC/ADM/Recruitment (MN-3)

දිනය / திகதி / Date: 2020.11. 01/12

14 DEC 2020

ලේකම්

ආරක්ෂක අමාත්‍යාංශය

**<u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අත්සන සඳහා යොමු කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2020.09.15 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පටිපාටියෙහි මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

අත්/කළේ : ආර්.ඩී.පී.එස්. ධර්මසේන

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත්:

1. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමඟ එවමි.)
2. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (මුල් පිටපත මේ සමඟ එවමි.)
3. ආයතන අධ්‍යක්ෂ ජනරාල් (මුල් පිටපත මේ සමඟ එවමි.)

(රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.08.21 දිනැතිව අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටියට එම කොමිෂන් සභාව විසින් 2020.01.28 දින දක්වා අනුමත කරනු ලැබූ සංශෝධනයන් ඇතුළත් කර සකස් කරනු ලැබූ සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය)

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.**

01. සම්බන්ධ වන ආයතන

| | | යොමු අංකය | දිනය |
|---|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | පුවි/1/17/බ.ගැ.පටිපාටි(V) | 2019.05.21 |
| 1.2 අමාත්‍යාංශය | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | NH/7/1/1/28(iii) | 2012.01.20 |
| | නිවාස, ඉදිකිරීම හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ED/10/NH/02/01/05-08 | 2019.08.08 |
| | ආරක්ෂක අමාත්‍යාංශය | | |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | | DMS/C04/29-02 | 2010.11.23 |
| | | DMS/C04/29-02 | 2011.01.18 |
| | | DMS/C/5/30 | 2011.10.25 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | | EST-2/RECRU/02/0223 | 2012.02.14 |
| | | EST-2/RECRU/02/0223 | 2018.03.21 |
| 1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | | NSCC/4/29/2/SR-1 | 2011.01.07 |
| | | NSCC/5/31/72/SR(තාවකාලික) | 2019.01.09 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | | PSC/EST/7/1/29/1/2012 | 2012.08.21 |
| පළමු සංශෝධනය | | PSC/EST/7/1/29/1/2012 | 2014.03.20 |
| දෙවන සංශෝධනය | | PSC/EST/7/1/29/1/2012 | 2015.04.08 |
| තුන්වන සංශෝධනය | | PSC/EST/7/1/29/1/2012 | 2016.02.11 |
| හතරවන සංශෝධනය | | PSC/EST/7/1/29/1/2012 | 2016.11.23 |
| පස්වන සංශෝධනය | | PSC/EST/7/1/29/1/2012 | 2020.01.28 |

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

3.2 ශ්‍රේණි : III ශ්‍රේණිය, II ශ්‍රේණිය, I ශ්‍රේණිය.

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයේ විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ විධායකය මඟින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස් පාලනය, මුදල් භාරකාරීත්වය හා මුදල් පරිහරණය අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුළත් බහුකාර්යය ස්වරූපයේ කාර්යයන් ඉටුකරන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම: ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත, ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

05. වැටුප් :

5.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

5.2 අනුමත තනතුරු නාමය : 1. සැලසුම් ශිල්පී
2. කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර)
3. පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී

5.3 වැටුප් කේත අංකය : MN - 03 - 2016

5.4 මාසික වැටුප් පරිමාණය: රු. 31,040 –10 x 445 – 11 x 660 – 10 x 730 – 10 x 750 – 57,550/=

5.5 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර : MN - 03 - 2016

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 31,040/= |
| II | පියවර 12 | 36,150/= |
| I | පියවර 23 | 43,480/= |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | ඒවාට පැවරෙන කාර්යයන් |
|---|---|---|---|
| i. සැලසුම් ශිල්පී | III, II, I | 22 | පැරණි ස්මාරක හා පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම හා අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා සංරක්ෂණ) ගේ උපදෙස් පරිදි සංරක්ෂණ කටයුතු ඉටු කිරීම. |
| ii. කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) | III, II, I | 44 | පැරණි ස්මාරක හා පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීමට අදාළ සියලු කටයුතු සම්පාදනය, තාක්ෂණ උපදෙස් ලබාදීම හා සංරක්ෂණ කටයුතු ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා සංරක්ෂණ)ට සහාය වීම. |
| iii. පුරාවිද්‍යා ප්‍රතිරූපන ශිල්පී | III, II, I | 10 | සෑම ආකාරයකම ඡායාරූප ගැනීම, මුද්‍රණය, ඡායාරූප රසායනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු, ඡායාරූප ලේඛනාගාරය භාරව සිටීම, ඡායාරූප ලේඛනයක් පවත්වාගෙන යාම හා සුවිගත කිරීම ඊට අදාළ ඇස්තමේන්තු සැකසීම, විඩියෝකරණය හා අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) ගේ උපදෙස් පරිදි ඡායාරූපකරණයට අදාළ රාජකාරී කටයුතු ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

1. සැලසුම් ශිල්පී - 22
2. කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) - 44
3. පුරාවිද්‍යා ප්‍රතිරූපන ශිල්පී - 10

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය.

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ |

සීමිත බඳවා ගැනීම උදෙසා සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති විට, එම ප්‍රමාණය ද විවෘත බඳවා ගැනීම මගින් සම්පූර්ණ කෙරේ.

i. III, II, I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක නිලධර සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

ii. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව /අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

iii. පුරප්පාඩු සංඛ්‍යාව 3ට අඩු නම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

සටහන

(1) පළමුව III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(2) III වන ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පවතී නම් පිළිවෙලින් එක් අවුරුදු හා දෑ අවුරුදු පුහුණු කාලසීමාවන් සඳහා බඳවා ගනු ලැබේ.

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණි : III ශ්‍රේණිය හා /හෝ පුහුණු කිරීමේ ශ්‍රේණිය.

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

| තනතුර | බඳවා ගනු ලබන ශ්‍රේණිය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර)<br><br>සැලසුම් ශිල්පී<br><br>පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී | වසර 02 ක පුහුණු කාලයක් සඳහා<br><br>එක් වසරක පුහුණු කාලයක් සඳහා<br><br>III ශ්‍රේණිය | විද්‍යාව/ ගණිත හෝ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, තාක්ෂණය සඳහා විද්‍යාව හෝ ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් සහිතව අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම.<br><br>සහ<br><br>සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම. |

7.2.2.2 වෘත්තීය සුදුසුකම්

| | කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) | සැලසුම් ශිල්පී | පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී |
|---|---|---|---|
| වසර 02 ක පුහුණු කාලයක් සඳහා | අදාළ නොවේ. | | |
| එක් වසරක පුහුණු කාලයක් සඳහා | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන කාර්මික විද්‍යාලයකින් ජාතික තාක්ෂණික (සිවිල් /පරිමාණ හා මිනුම්) සහතිකය ලබා තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන කාර්මික විද්‍යාලයකින් එක් අවුරුදු පූර්ණකාලීන සැලසුම් ශිල්පය පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන ආයතනයකින් එක් අවුරුදු පූර්ණකාලීන හෝ දෑ අවුරුදු අර්ධකාලීන ඡායාරූපකරණය පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම. |
| III ශ්‍රේණිය | i. මොරටුව විශ්ව විද්‍යාලයෙන් හෝ අම්පාරේ හාඩි ආයතනයෙන් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්)<br>ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්)<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්)<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්)<br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම.<br>vi. ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියළු අතින් සම්බන්ධ යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම්<br>vii. රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. | | ඡායාරූපකරණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. |

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් මනා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට 7.2.2 සිට 7.2.3 දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

විභාග විෂය නිර්දේශය ඇමුණුම 1 හි දැක්වේ.

7.2.4.1.1 පවත්වන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නැත.

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නැත.

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීමේ සුදුසුකම් සහ ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් පත්කරනු ලබන බලධරයා

7.2.5.අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය හා /හෝ පුහුණු කිරීමේ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම.

7.3.2.2 වෘත්තිය සුදුසුකම් :7.2.2.2 හි සඳහන් පරිදි සුදුසුකම් අදාළ වේ.(එක් අවුරුදු පුහුණුව සඳහා බඳවා ගැනීම සඳහා අදාළ සුදුසුකම් සහිතව ක්ෂේත්‍රයට අදාළ වසර පහ (05) ක පළපුරුද්ද තිබිය යුතුය.)

7.3.2.3 පළපුරුද්ද :

| තනතුර | බඳවා ගනු ලබන ශ්‍රේණිය | පළපුරුද්ද |
|---|---|---|
| 1. කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර)<br><br>2. සැලසුම් ශිල්පී<br><br>3. පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී | වසර 02 ක පුහුණු කාලයක් සඳහා | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක දෙපාර්තමේන්තුගත තනතුරක ක්ෂේත්‍රයට අදාළ වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| | එක් වසරක පුහුණු කාලයක් සඳහා<br><br>III ශ්‍රේණිය | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක දෙපාර්තමේන්තුගත තනතුරක ක්ෂේත්‍රයට අදාළ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

7.3.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :
i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. නියමිත දිනට පූර්වාසන්නව මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.
iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.3.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

විභාග විෂය නිර්දේශය ඇමුණුම 01 හි දැක්වේ.

7.3.3.1.1. පවත්වන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගන්නා ලද පුහුණුලාභීන් දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කර පසු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගය සමත්වීමෙන් පසු III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ. විභාගයෙන් සමත්වීමට 40% ක් ලකුණු ලබාගත යුතු අතර, පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුව ලකුණු ප්‍රමුඛතාවය මත පත්කිරීම සිදුකරනු ලැබේ.

(විෂය නිර්දේශය ඇමුණුම 02 හි දැක්වේ)

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නැත.

7.3.3.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නැත.

7.3.3.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීමේ සුදුසුකම් සහ ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා.

7.3.3.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

7.3.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අභ්‍යන්තරව දැන්වීම් ප්‍රසිද්ධ කිරීම් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.5 පුහුණු කාලසීමාව අවසානයේ ශ්‍රේණියට බඳවා ගැනීම

i. දෑ අවුරුදු පුහුණු කාලයකට බඳවා ගනු ලබන අපේක්ෂකයින් තනතුරට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු III වන පන්තියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

ii. එක් අවුරුදු පුහුණු කාලයකට බඳවා ගනු ලබන අපේක්ෂකයින් තනතුරට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදාළ විභාගය සමත් වීමෙන් පසු III වන පන්තියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

iii. ඉහත i, ii යටතේ පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාවක් ලබා දෙනු ලබන අතර, එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලබන අතර සීමිත ධාරාව යටතේ පුහුණුවට බඳවාගත් නිලධාරීන් පූර්ව තනතුරට පෙරලා යවනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම් : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

09. භාෂා ප්‍රවීණතාව : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුයි.

10. ශ්‍රේණි උසස් කිරීම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුයි.

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන්නේ වසර 2 ක හෝ 1ක පුහුණු කාලසීමාව අවසානයේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගය සමත්වීමෙන් පසු III ශ්‍රේණියට පත් කරනු ලැබේ.
මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පොදු කොන්දේසි අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

"සක්‍රීය සේවා කාලය යනු" වැටුපක් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි අන්තර්ග්‍රහණය කිරීම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුයි.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

| | |
|---|---|
| සකස් කළේ : | පරීක්ෂා කළේ : |
| අත්සන ..................... | අත්සන ..................... |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා) |
| නම :- | නම :- |
| තනතුර :- | තනතුර :- |
| දිනය :- 30/07/2020 | දිනය :- 2020/07/31 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : .....................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : .....................

තනතුර : .....................

නිල මුද්‍රාව : .....................

ආචාර්ය සෙනරත් දිසානායක
පුරාවිද්‍යා අධ්‍යක්ෂ...
පුරාවිද්‍යා දෙපා...
කොළඹ 07.

දිනය : 2020/07/31

යොමු අංකය : .....................

යොමු අංකය : MOD/PAC/ARC/ADM/Recruitment Com

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.08.21 දිනැතිව අනුමත කරනු ලැබූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට එම කොමිෂන් සභාව විසින් 2020.01.28 දින දක්වා අනුමත කරනු ලැබූ සංශෝධනයන් ඇතුළත් කර සකස් කරනු ලැබූ සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම :

ලේකම්,

ආරක්ෂක අමාත්‍යාංශය.

දිනය : 19/06/2020

නිල මුද්‍රාව :

---

යොමු අංකය : PSC/EST/7/1/29/1/2012

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.08.21 දිනැතිව අනුමත කරනු ලැබූ සහ එම කොමිෂන් සභාව විසින් 2016.11.23 දින දක්වා අනුමත කරනු ලැබූ සංශෝධනයන් අනුව ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි සංශෝධනයන් ඇතුළත් කර සකස් කරනු ලැබූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය 2020.01.28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

දිනය : 2020.11.25

නිල මුද්‍රාව : එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඇමුණුම 01

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නිලධර තනතුරුවල පුහුණු කිරීමේ ශ්‍රේණියට හා III ශ්‍රේණියට අයදුම්කරුවන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය හා සීමිත තරඟ විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 ½ | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :පුරප්පාඩු ඇතිවන අවස්ථාවන්හී දී.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තියන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | (අ) සැලසුම් ශිල්පී හා කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) තනතුරු සඳහා.<br>i. ඓතිහාසික ස්මාරක පිළිබඳ මූලික අවබෝධය.<br>ii. සැලසුම් සකස් කිරීම / ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම.<br>iii. සැලසුම් ඇඳීම හා උපකරණ පිළිබඳ අවබෝධය / ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ දැනුම.<br><br>(ආ) පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පී තනතුරු සඳහා<br>i. මූලික ඡායාරූප උපකරණ පිළිබඳ දැනුම.<br>ii. ඡායාරූප ගැනීමේ තාක්ෂණ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම.<br>iii. ඡායාරූපකරණයට අදාළ රසායන ද්‍රව්‍ය පිළිබඳ දැනුම.<br>iv. මුද්‍රණ කඩදාසි වර්ග පිළිබඳ දැනුම.<br>v. ඡායාරූපකරණය පිළිබඳ මූලධර්ම. |

සකස් කළේ :

අත්සන : ......... 
නම : .........
තනතුර: .........
දිනය : ......... 20/07/...

ආර්.එම්.එස්. ප්‍රසාදනි අමරසිංහ
අධ්‍යක්ෂ (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I පන්තිය)
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ - 07

පරීක්ෂා කළේ :

අත්සන : .........
නම : .........
තනතුර: .........
දිනය : .........

පී.ඒ.එස්.එච්. බොරලැස්ස
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ පන්තිය)
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ - 07

අත්සන : .........

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : .........
තනතුර : .........
දිනය : 2020/07/31
නිල මුද්‍රාව : .........

ඇමුණුම 02

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නිලධර තනතුරුවල පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් III වන ශ්‍රේණියට පත් කිරීම සඳහා විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇති වන අවස්ථාවල දී.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය සඳහා තාක්ෂණය හා ශිල්ප ක්‍රම. | i. ස්මාරක සංරක්ෂණයට අදාළ සැලසුම් පිළියෙල කිරීම.<br>ii. සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ඇස්තමේන්තු පිළියෙල කිරීම.<br>iii. වාස්තු විද්‍යා සංරක්ෂණ පිළිබඳ මූලධර්ම<br>iv. ස්මාරකයක් පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම. |
| 2. කාර්මික නිලධාරී පුහුණු ශ්‍රේණිය සඳහා තාක්ෂණය හා ශිල්ප ක්‍රම. | i. ඓතිහාසික ස්මාරක පිළිබඳ මූලික අවබෝධය.<br>ii. වාස්තු විද්‍යා සංරක්ෂණය පිළිබඳ සාමාන්‍ය අවබෝධය.<br>iii. ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම.<br>iv. ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ දැනුම. |
| 3. පුරාවිද්‍යා ප්‍රතිරූපන ශිල්පී පුහුණු ශ්‍රේණිය සඳහා තාක්ෂණය හා ශිල්ප ක්‍රම. | i. ඡායාරූපකරණයට අදාළ තාක්ෂණය, උපකරණ, රසායන ද්‍රව්‍ය පිළිබඳ දැනුම.<br>ii. ඡායාරූපකරණය පිළිබඳ මූලධර්ම.<br>iii. ඡායාරූප සංරක්ෂණ දැනුම. |

සකස් කළේ :
අත්සන : ..............................
නම : ..............................
තනතුර: ..............................
දිනය : 30/07/2020

පරීක්ෂා කළේ :
අත්සන : ..............................
නම : ..............................
තනතුර: ..............................
දිනය : 2020/07/31

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..............................
තනතුර : ..............................
දිනය : 2020/07/31
නිල මුද්‍රාව : ..............................

ආචාර්ය සෙනරත් දිසානායක
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07.